පටිච්චසමුප්පාදය (එකළොස්වෙනි කොටස)
17.08.2019 - ශ්‍රී ලංකාරාමය
නවසීලන්තය

අපි මේ වෙලාවේදී සැම දෙනාටම කියලා දෙන ධර්ම කරුණු ටික ඉතාමත්ම හොඳින් වටහාගෙන තේරුම් අරගෙන ඒවාගේම හිතේ දරාගෙන ඒ අනුව මනසිකාරය පවත්වලා ධර්ම ස්වභාවය හොඳට තේරුම් අරගෙන සංසාර දුකින් එතෙර වෙලා නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා ප්‍රාර්ථනා කරනවා.

හේතුඵල ධර්මයන්ගේ තිබෙන ස්වභාවය තමයි මේ කියාගෙන යන්නේ. ධර්ම එකිනෙකට හේතුවෙන විදිය කියාගෙන යනවා. මේ ඔක්කොම ධර්ම හේතුවත් වෙනවා ඵලයත් වෙනවා. හේතුඵල කියන කථාව කිව්වහම අපිට තේරෙන්නේ හේතුව එකක් ඵලය එකක් කියලා. එහෙම උනානම් ලේසියි තේරුම් ගන්න. නමුත් මේකේ ටිකක් අමාරුකම තිබෙන්නේ එක ධර්මයක් හේතුවකුත් වෙනවා ඵලයකුත් වෙනවා. හේතුවයි ඵලයයි එකම ධර්මයක් වෙන නිසා මේක ටිකක් අමාරුයි තේරුම් ගන්න. මේ කියාපු කථාව මේ පින්වතුන්ට වැටහේවි කියලා මම හිතනවා. මේක අමාරුයි කියලා හිතන්න හොඳ නෑ. බොහොම සීමිත ප්‍රමාණයක තමයි මේවා කථා කෙරෙන්නේ. ඒක හරි කණගාටුදායක කාරණයක්. වැඩිපුර තිබෙන්නේ ලෝකයට සම්බන්ධ දේශනා. හිත හදන වැඩ සටහන් හරි අඩුයි. බොහෝම අතලොස්සයි ඒවා තිබෙන්නේ. ඒ හිත හදන්න යන වැඩ සටහනෙත් හිත පිළිබඳව කියවෙන ධර්ම කරුණු හරිම සීමිතයි. පිරිලා තිබෙන්නේ ලෝකයට සම්බන්ධ කථන. ඒ පිළිබඳ මොනතරම් දේශනා කළත් ඒ සංස්කාරයන්ගේ ස්වභාවය හදන්න අමාරුයි. ඒක නිසා අපි හිත හදාගෙන යන්න ඕනෑ.

මේ පටිච්චසමුප්පාද කරුණු මෙනෙහි කිරීම ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ඇසීම් හරි අඩුවෙන් කෙරෙන්නේ. නැත්තේම නෑ, තිබෙනවා නමුත් හරි අඩුයි. ඒක නිසා මේක අමාරුයි කියලා හිතන්නේ නැතුව මේක අපි simplify කරලා හරි තේරුම් ගන්න ඕනෑ. මම කිව්වා මේක ටිකක් ආමරුවෙන්නේ එක ධර්මයක් හේතුවකුත් එනවා ඒ ධර්මයම ඵලයකුත් වෙන නිසා කියලා. හිතලා බලන්න, දැන් මේ ඉන්න පිරිස මේ මහත්මයාලා නෝනලා ටික හේතුවකුත් උනා ඵලයකුත් උනා. ඵලය කියලා කියන්නේ, මේ පින්වතුන්ට කියනවා දුව පුතා කියලා. එහෙම කියන්නේ අම්මයි තාත්තයි හින්දා. එතකොට අම්මයි තාත්තයි නිසා තමයි මේ දුව - පුතා ඇවිල්ලා තිබෙන්නේ.

මේ පින්වතුනුත් කාටහරි දුව පුතා කියලා කියනවා. එතකොට මෙතැන ඉන්න කෙනෙක් දුව උනේ, මෙතැන ඉන්න කෙනෙක් පුතා උනේ තව හේතුවක් හින්දා. එතකොට පුතා දුව කියලා කියන්නේ ඵලයක්. ඊට පස්සේ ඒ ඵලය හේතුවක් වෙනවා තමන්ගේ දුවට සහ පුතාට. එතකොට එක ධර්මයක් එක පැත්තකින් 'හේතුවකුත්' වෙනවා, එක පැත්තකින් 'ඵලයකුත්' වෙනවා. පිටි පස්සට හැරිලා බැලුවට පස්සේ මම 'ඵලයක්'. අනාගතයට හැරුනට පස්සේ මම 'හේතුවක්'. හැබයි හේතුවයි ඵලයයි දෙකම තිබෙන්නේ වර්තමානයේ.

නමුත් ඒ කාරණයම අනිත් පැත්තට හිතන්න හොඳ නෑ. මමම අම්මා වෙලා මමම දුව වෙනවා කියලා හිතන්න හොඳ නෑ. මමම තාත්තා වෙලා මමම පුතා වෙනවා කියලා හිතන්න හොඳ නෑ. මම පුතා වෙන්නේ තවත් තාත්තා කෙනෙකුට අම්ම කෙනෙකුට. මම පියෙක් වෙනවා නම් හෝ මවක් වෙනවා නම් වෙන්නේ වෙනත් කෙනෙකුට. අනාගතය පැත්තට ඵලය බැලුවහම තමන් හේතුවක් වෙනවා. අතීතය පැත්තට කාරණය බැලුවහම තමන් ඵලය වෙනවා. ඒක නිසා එක ධර්මයක් ‘හේතුවකුත්’ වෙනවා ‘ඵලයකුත්’ වෙනවා. මේකත් තේරුම් ගන්න ඕනෑ.

අපි අද කථා කරන්න යන්නේ **ඵස්ස පච්චයා වේදනා** කියන කොටස. ඉස්සෙල්ලා අපි කථා කළා **සළායතන පච්චයා ඵස්සො** කියන කොටස. **ඵස්ස පච්චයා වේදනා** කියන එක බැලූ බැල්මට ලේසියි කියලා හිතෙනවා නමුත් ඒකෙ හිතිය යුතු පැති කීපයක් තිබෙනවා. වේදනාව ඵලයක් හැටියට සලකනවා, ස්පර්ශයේ ප්‍රතිඵලය තමයි වේදනාව = ඵස්ස පච්චයා වේදනා. ඊළඟට වේදනාව නිසා ඇති වෙනවා තණ්හාව. මේකෙදි පරෙස්සම් වෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. එකක් තමයි **ඵස්ස පච්චයා වේදනා** කියලා කිව්වහම ස්පර්ශය කියන එක වේදනාවල් හදන ධර්මයක් නොවෙයි. බේකරියේ පාන් හදනවා, ෆාර්ම් එකේ එළවලු හදනවා වගේ මේ ස්පර්ශය කියන එක වේදනාවල් නිෂ්පාදනය කරන්නා වූ නිෂ්පාදනාගාරයක් නොවෙයි. වේදනාව වෙන එකක්. ස්පර්ශය වෙන එකක්.

ඵස්ස පච්චයා වේදනා කියන කථාව කියලා කාගෙන් හරි ඇහුවොත් වේදනාව කොහෙන්ද එන්නේ කියලා ස්පර්ශයෙන් එන්නේ කියලා කියන්න පුළුවන්. වේදනාව නිෂ්පාදනය කරන්නේ ස්පර්ශය කියලා කියන්න පුළුවන්. නමුත් ඒක වැරදියි. එහෙම නම් ස්පර්ශයට තිබෙන්න ඕනෑ මාතෘත්වය. මාතෘත්වය කියලා කියන්නේ වේදනාවල් හදන ශක්තිය, වේදනාවල් හදන බලය වේදනාවල් හදන ධර්මය තිබෙන්න ඕනෑ. නමුත් එහෙම ගතියක් ස්පර්ශයේ නෑ. ස්පර්ශයට වේදනාවල් නිෂ්පාදනය කරලා දෙන්න බෑ. ස්පර්ශය කියලා කියන්නේ වේදනාව මතු කරලා දෙන්න උදව් කරන කාරණාවක් පමණයි. වේදනාව කියලා කියන්නේ එක ධර්මයක්. ස්පර්ශය කියලා කියන්නේ තවත් ධර්මයක්. මේ දෙක ධර්මතා දෙකක්. ඒක නිසා ස්පර්ශය කියලා කියන්නේ වේදනාවල් නිෂ්පාදනය කරන මාතෘගුණයක් තිබෙන එකක් නොවෙයි. ස්පර්ශය කියන්නේ වේදනාව මතු වෙන්න හේතු වෙන එක්තරා කාරණාවක් පමණයි. වේදනාව මතු වෙන්න උපකාර වෙන ළඟම ඇති ධර්ම තමයි ස්පර්ශය. ස්පර්ශය ඇතිවෙච්ච ගමන් ඒ ළඟින්ම ඉන්න වේදනාව මතුවෙනවා. මේ විදියට ස්පර්ශයේ උපකාරය ලබනවා හැර වේදනාව සකස් කරන ධර්මයක් නොවෙයි ස්පර්ශය. මේ කාරණය හොඳට තේරුම් ගන්න ඕනෑ. **ඵස්ස පච්චයා වේදනා** කියලා කිව්වහම මේක එක කාරණයක්.

අනිත් කාරණය තමයි, ලෝකයේ මිනිස්සු දුකට කැමති නෑ, දුකයි දුකයි කිය කියා අඬ අඬා හැසිරෙනවා. මිනිස්සු පොලීසියට යන්නෙත් දුකට බෙහෙත් ගන්න. ඉස්පිරිතාලෙට යන්නෙත් දුකට බෙහෙත් ගන්න. අපිට ඇතිවෙනවා කායික රෝගයක්. ඒක දුක්ඛ වේදනාවක්. එතකොට ඒකට බෙහෙත් ගන්න අපි දොස්තර මහත්මයා ගාවට යනවා. ඒක කායික වේදනාවක්. ඒවගේම අපිට අයිති දෙයක් කවුරුහරි හොරකම් කරනවා.

එතකොටත් අපිට ඇතිවෙනවා දුකක්. ඒ දුකට බෙහෙත් ගන්න අපි යනවා පොලීසියට. ඒවගේම තමයි අපිට වෙන අසාධාරණකම් වලදී ඇතිවෙන දුක්ඛ වේදනාවල් වලට බෙහෙත් ගන්න අපි යන්නේ මානව හිමිකම් සඳහා වෙන් වූ කාර්යාල වලට. ඒ කාර්යාල වල ඉන්න අයට ඇතිවෙන මානසික වේදනාවල් වලට ඒ අය counselling යනවා. ඒ වගේ මේ දුක කියන එක අපි handle කරන්නේ ලෝක මට්ටමෙන්. ඒක තමයි අපිට තිබෙන ප්‍රශ්නය.

කන්න නැති උනහම දුකයි, රස්සාවක් නැති උනහම දුකයි, පුරුෂයෙක් නම් භාර්යාවක් නැති උනහම දුකයි, කාන්තාවක් නම් ස්වාමියෙක් නැති උනහම දුකයි. දෙන්නම එකතු උනහම දරුවෝ නැති එක දුකයි. දරුවෝ ඉන්නවානම් උගන්න දුකයි, කන්න දෙන්න දුකයි. මේවගේ මේ හැම තැනකම තිබෙන්න දුක්ඛ වේදනාව. මේ දුක්ඛ වේදනාවට එක එක අර්ථ කථන දක්වලා තිබෙනවා. Stress කියනවා anxiety කියනවා depression කියලා කියනවා. මුළු ලෝකයටම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ දුක්ඛ වේදනාව. හිතට යම්කිසි බයක් ඇති කරන, තර්ජනය කරන, කිසි දෙයක් කරගන්න බැරි වෙච්ච, time එකෙන් හිර වෙලා තිබෙන අමුතු සැක සහිත ගතියට කියනවා Anxiety disorders කියලා. දැන් මේ ගතිය ඇති උනහමත් දුකයි. මේ ලෝකයේ මිනුස්සු දුක්ඛ වේදනාවට බයයි.

මේ දුක්ඛ වේදනාවල් වල නොයෙකුත් levels තිබෙනවා. පොඩි වේදනාවල් තිබෙනවා, ලොකු වේදනාවල් තිබෙනවා. ඥාති ව්‍යසන තිබෙනවා, තමන්ව ගණන් ගත්තේ නෑ කියලා දුකක් තිබෙනවා. සැලකුවේ නෑ කියලා දුකක් තිබෙනවා. මේක තමයි අපිට තිබෙන ප්‍රශ්නය. මේ දුක කියන එක එන්නේ නැත්නම් මිනිස්සු නිවන් දකින්න උත්සාහ ගන්නේ නෑ. මේක තමයි දුක නමුත් බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා මේ වේදනාවේ ආකාර තුනක් තිබෙනවා කියලා. ඒ තමයි **සුඛ වේදනාව, දුක්ඛ වේදනාව, අදුක්ඛමසුඛ වේදනාව**. මේ වේදනා තුනම ඇතිවෙන්නේ ස්පර්ශය හේතු කරගෙනයි. සැප වේදනාවෙත් තිබෙනවා යම්කිසි දුකක් උපදවන ගතියක්. දුකෙත් තිබෙනවා දුක ගතියක්. උපේක්ෂා වේදනාවේත් තිබෙනවා යම්කිසි ගතියක්. දැන් අපි බලමු ස්පර්ශය නිසා කොහොමද වේදනාව හටගන්නේ කියලා.

වේදනා පච්චයා තණ්හා කියලයි කියන්නේ. අපි සමාන්‍යයෙන් දුකයි දුකයි කියලා කියන්නේ දුක්ඛ වේදනාවට. සැප වේදනාවට දුකයි කියලා කියන්නේ නෑ. නමුත් බුදුරජාණන් වහන්සේ වේදනා තුනක් දක්වනවා. මම මේ කාරණාව පොතේ තිබෙන හැටියට නැතුව මට දැනෙන විදියට මේ පින්වතුන්ට කියලා දෙන්නම්. එතකොට තේරේවි කියලා මම විස්වාස කරනවා.

කවදාකවත්ම ස්පර්ශය නිසා වේදනාව පමණක් හුදකලාව උපදින්නේ නෑ. වේදනාව ඇතිවෙන්න නම් විඤ්ඤාණයක් තිබෙන්නම ඕනෑ. කවදාකවත්ම වේදනාවක් උපදින්නේ නෑ විඤ්ඤාණයක් නැතිව. ඒවගේම කවදාකවත්ම විඤ්ඤාණයක් පහළ වෙන්නෙත් නෑ වේදනාවක් නැතුව. ඒක තමයි විශේෂය.



මේ වස්තුවේ තිබෙනවා යම් කිසි ගුණයක්. පොදුවේ මේකට පාලියෙන් කියනවා ආරම්මණය කියලා. සිංහල භාෂාවෙන් අරමුණ කියලා කියනවා.

මේ අරමුණේ තිබෙනවා කරුණු දෙකක්. එකක් තමයි ‘අරමුණ’. අනිත් එක තමයි ‘ආරම්මණ රසය’. මේ අරමුණට බෑ ආරම්මණ රසය දැන ගන්න. ආරම්මණ රසයට බෑ අරමුණ දැනගන්න. අරමුණයි ආරම්මණ රසයයි දෙක එකතැන තිබෙන්නේ. ඒවා දැන ගැනීමේ ගතියෙන් ශූන්‍යයයි. ඒවා අවිඤ්ඤාණකයි. මේ අරමුණ දෙස බලන කෙනාගේ ඇස ගිහිල්ලා කෙලින්ම අරමුණේ හැප්පෙන්නේ නෑ. ඇස තිබුණාට ඇසටත් රූපයටත් එකතු වෙන්න බෑ. ඇසයි රූපයයි දෙක එකතු කරන coordinator වැඩේ කරන කෙනා ඉන්නේ සිත ඇතුලේ.

සිතට කියනවා විඤ්ඤාණය කියලා. විඤ්ඤාණය තිබුණාට ඒකට අරමුණට යන්න බෑ. විඤ්ඤාණයට තිබෙන්නේ දැන ගන්නා ගතිය පමණයි. Travel කරන ගතිය විඤ්ඤාණයට නෑ. මේ හිතේ තිබෙනවා විඤ්ඤාණය අරමුණට කැඳවාගෙන යන එක්තරා ගුණයක්. ඒක කරන්නේ ස්පර්ශයයි. නමුත් ස්පර්ශයට බෑ අරමුණ දැනගන්න. ස්පර්ශයට කරන්න පුළුවන් coordinator වැඩේ විතරයි. මේ ඵස්සය විඤ්ඤාණයත් සමග ඇස හරහා අරමුණට ගමන් කරනවා. විඤ්ඤාණයට රූපය දැන ගැනීමේ හැකියාව ලැබුණේ ස්පර්ශය නිසා. ස්පර්ශය කරන්නේ විඤ්ඤාණය අරමුණට කැඳවාගෙන යන එකයි. අපි කථා ව්‍යවහාරයේදී කියනවා සිත අරමුණට යනවා කියලා. නමුත් ඇත්තටම එහෙම වෙන්නේ නෑ. එහෙමනම් අපි ගසක් දෙස බලනකොට අපේ ඇහැ ගහේ වදින්න ඕනෑ. නැත්නම් ගහ ගැලවිලා අපේ ඇස ගාවට එන්න ඕනෑ. එහෙම වෙන්නේ නෑ. ස්පර්ශය කරන්නේ අරමුණට තට්ටු කරලා ඒ අරමුණ ඇස ගාවට ගන්නවා. සිත ඇස ගාවට යනවා. චක්ඛු විඤ්ඤාණය ඇසේ පහළ වෙනවා. ඇස තමයි සන්ධිස්ථානය.

'ඇසට' කියනවා 'චක්ඛායතනය' කියලා. 'විඤ්ඤාණයට' කියනවා 'මනායතනය' කියලා. චක්ඛායතනයයි මනායතනයයි දෙක රූපයට සම්බන්ධ කළේ 'ස්පර්ශය'.

විඤ්ඤාණය ඇසේ නැවතිලා අරමුණ දැන ගත්තා. ආරම්මණය දැන ගන්න පුළුවන් කම තිබෙන්නේ විඤ්ඤාණයට පමණයි. නමුත් මේ අරමුණේ ගති දෙකක් තිබෙනවා. ආරම්මණය සහ ආරම්මණ රසය(ගුණය). ආරම්මණයේ තිබෙන ආරම්මණ ගුණය ගන්න බෑ විඤ්ඤාණයට. ඒක නිසා නිසා විඤ්ඤාණය සමග යනවා තව සහචරයෙක්. ඒතමයි 'වේදනාව'. එතකොට විඤ්ඤාණය අරමුණ දැන ගන්නවා. වේදනාව අරමුණේ තිබෙන්නා වූ රසය විඳිනවා. වේදනාවට ආරම්මණය දැන ගන්න බෑ. වේදනාව යන්නේ එහි ඇති රසය විඳ ගන්න. ප්‍රධානියා යනකොට අනිත් කට්ටියත් යනවා.

මම අහලා තිබෙනවා කවුරුහරි ලොකු මැති ඇමතිවරු මළ ගෙවල් වලට යනකොට ඒ අයගේ ගෝල බාලයොත් යනවා කියලා. නමුත් ගෝල බාලයන්ගෙන් ඒ අයට ඇති වැඩක් නෑ. ඇමති වරයා තමයි ඒ ගෙදර මිනුස්සුත් එක්ක කථා කරන්නේ. ගෝල බාලයෝ කෑම බිම තිබෙන තැන නවතිනවා. වේදනාවත් ඒ වගේ. 'හිත' ඇමති වරයා වගේ. 'වේදනාව' ගෝල බාලයෝ වගේ. අරමුණේ ඇති රසය ගාව 'වේදනාව' නවතිනවා. 'විඤ්ඤාණය' අරමුණේ නැවතිලා අරමුණ දැන ගන්නවා. මේ දෙගොල්ලෝ එක්කාසු කළේ ඵස්සය. අපිට නොතේරුණාට එක අවස්ථාවේදී කෘත්‍ය ධර්ම ගොඩක් සිද්ධ වෙනවා. අපිට ඒක වැටහෙන්නේ නෑ. අපි පුරුදු වෙලා තිබෙන්නේ මේ ඔක්කොම එක පොදියට දාලා එකට බලන්න. නමුත් එහෙම නොවෙයි. එක තැනක එක ධර්මයක මේ වගේ ගුණ විශේශිත ගති මහා රාශියක් තිබෙනවා. බුදුරජාණන් වහන්සේලා මේ සියල්ලම වෙන වෙනම දැකලා අපිට දේශනා කළා.

විඤ්ඤාණය අරමුණට තනියම යන්නේ නෑ, වේදනාව අරමුණට තනියම යන්නේ නෑ, ස්පර්ශය අරමුණට තනියම යන්නේ නෑ. මේ අය යන්නේ එක පොකුරට.

සෑම අරමුණකම පොඩි හෝ වේවා ලොකු හෝ වේවා ආරම්මණ රසයක් තිබෙනවා. ඒ ආරම්මණ රසය target වෙන්නේ 'වේදනාවට'. ඒක නිසා කවදාකවත් 'ඵස්සය' උපකාර උනේ නැත්නම් 'වේදනාව' වැඩ කරන්නේ නෑ. නමුත් ස්පර්ශය ඇතුලෙන් නොවෙයි වේදනාව උපදින්නේ. වේදනාව කියලා කියන්නේ වෙනමම ධර්මයක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස මෙහිදී වේදනාවෙන් දැන ගන්න අරමුණු රසය කියන්නේ වර්ණයටද?

<u>පිළිතුර</u> - ඇසට ගන්නේ අරමුණේ තිබෙන වර්ණය පමණයි. මේ සෑම වර්ණයකම තිබෙනවා වර්ණය සහ අපේ හිත කිතිකවලා සනසවලා සලිත කරවන අමුතු ගුණයක්. වර්ණය තමයි අරමුණ. ඒක අරමුණ උනාට ඒකෙ අස්සේ තිබෙනවා අපේ හිත පිරිමදින හොඳ හරි නරක හරි යම්කිසි ගතියක්. වර්ණයේ තිබෙන්නාවූ හොඳ හෝ නරක හෝ ඒ ගතිය දැනෙන්නේ වේදනාවට.

නමුත් චක්ඛු විඤ්ඤාණ අවස්ථාවේ තිබෙන්නේ උපේක්ෂා වේදනාවක්. මේක උදාහරණයක් හැටියට කියන්නේ. අපි සිතට ගත්තු වේදනාව සැප දුක් වශයෙන් වැඩිපුර රහ කරලා ගන්නේ අරමුණේ තිබුණා වූ ආරම්මණ රසයයි. ඒක හරියට කියනවානම් මෙහෙමයි. අපි හිතමු කිලෝ එකක් බර කේක් එකක් ගෙනාව කියලා. ඒක ලොකු කේක් එකක්. ලොකු කියලා කිව්වහම ඒක ප්‍රමාණයක්. නමුත් කිලෝ කියලා කිව්වහම ප්‍රමාණයක් නොවෙයි, ඒක බරක්. දැන් මේ බරයි ඒකෙ size එකයි කියන්නේ දෙකක්. අපි ඒකෙන් කේක් කෑල්ලක් ගන්නවා. කේක් කෑල්ලක් අරගෙන ඒකෙ ගුණය මනින්න අපි පොඩි කෑල්ලක් කනවා. එතකොට ඒකෙ ඇතුලේ තිබෙනවා අමුතු රසක්. ඒ ‘රසය’ දෙන්නේ කිලෝ ගානට නොවෙයි. ‘ගෑම් 10 ක රස’ කියලා ‘රස’ එහෙම දෙන්නේ නෑ.

එතකොට ‘කේක් එකයි’ ‘කේක් ඒකෙ රසයි’ කියලා කියන්නේ දෙකක්. එතකොට අපි කේක් කෑල්ලක් කාල බලන්නේ ඒකෙ බරත් නොවෙයි ප්‍රමාණයත් නොවෙයි අපි බලන්නේ ඒකෙ ‘රස’. චක්ඛු විඤ්ඤාණයට ගොදුරුවෙන අරමුණෙත් එහෙමයි. අරමුණත් කේක් එක වගෙයි. ඒකෙ තිබෙන්නා වූ රසත් කේක් ඒකේ තිබෙන්නා වූ රස වගෙයි. ඒ වගේ අරමුණක තිබෙනවා ‘අරමුණයි’ ‘අරමුණු රසයයි’ කියන දෙකම. අපිට අරමුණු දැනෙන්නේ ඒ අරමුණේ තිබෙනවා අපේ ආයතන පිරිමැදලා සනසාගෙන යන ගතියක්. සමහර වෙලාවට තිබෙනවා අපේ සිත සූරන අරමුණු. එහෙම අරමුණු දැක්කහම අපේ හිත තලාගෙන හූරාගෙන තුවාලකරගෙන රිද්දගෙන යනවා.

සද්දයෙත් එහෙමයි. සද්දයක් ඇහෙනකොටත් ඒකෙ තිබෙනවා හොඳ ශබ්දයක් හැටියට ඇසී යන ගතියක් හෝ නරක සද්දයක් හරියට ඇසී යන ගතියක්. සද්දය කියන්නාවූ අරමුණයි සද්දය අස්සේ තිබෙන්නා වූ සද්ද රසයයි කියන්නේ දෙකක්. ඒ සද්දයේ තිබෙන්නා වූ හොඳ හෝ නරක විඳ ගන්නේ ‘වේදනාව’. අපිට කියන්න ඕනෑ උනේ වේදනාව මතුවෙන්න ළඟම හිතවතා ස්පර්ශය බව.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස අපි ආරම්මණ රසය නැති කරගත්තොත් වේදනාව කියන එක නැතිවෙනවා කියන එක හරිද?

<u>පිළිතුර</u> - ආරම්මණ රසය නැති කරන්න බෑ. ඒක කවදාකවත් වෙන්නේ නෑ. අරමුණක් ආවොත් අරමුණු රසය තිබෙනවාමයි.

අරමුණක් ගත්තහම ඒ අරමුණේ තිබෙනවා විඤ්ඤාණයට කොටසකුත් වේදනාවට කොටසකුත්. විඤ්ඤාණයේ කෘත්‍යය අරමුණ දැනගැනීමයි. වේදනාව කරන්නේ රස විඳීමයි. ඔය දෙකටම හේතු වෙන්නේ ස්පර්ශයයි. **ඵස්ස පච්චයා වේදනා** කියලා කියන්නේ ඒකයි.

වේදනාව හොඳට දැනෙන්න නම් අරමුණ හොඳට අහුවෙන්නත් ඕනෑ. අපි හිතමු එතරම් පැහැදිලි නැති ෆොටෝ එකක් තිබෙනවා කියලා. එතකොට අපිට ඒකෙ ඉන්නේ කවුද කියලා හරියට වැටහෙන්නේ නෑ. නමුත් මොකක් හරි සටහනක් සංඥාවක් තිබෙනවා ඒකෙ. ඒ අරමුණ එතරම් පැහැදිලි නැති නිසා අරමුණක් කියලා දැනගත්තට ඒකේ අරමුණු රසය හොඳටම එන්නේ නෑ, පොඩියට ටිකක් තිබෙනවා. අරමුණ හොඳට පැහැදිලිව

දැනෙනවා නම් රස දැනීමත් හොඳයි. අරමුණ දුරයි නම් ඒත් දැන ගැනීමේ ගතිය අඩුයි, එතකොට රස දැනෙන ගතියත් අඩුයි. අරමුණට හොඳට ලයිට් වැටිලා පැහැදලිව පිරිසිදුව හොඳට හිතට දැනෙනවානම් ඒක හොඳට තේරෙනවා. අපි හිතමු කෙනෙක් නාට්‍යයක් බලනවා කියලා පිටි පස්සට වෙලා හිටගෙන. ඒ ගොල්ලන්ට දුර හින්ද කථා කරන ඒවා, ඒ දර්ශන තේරෙනවා අඩුයි. ඒක නිසා ඒ අය ටිකක් ඉස්සරහට යනවා. එතකොට ආරම්මණය හොඳට පේනවා, එතකොට රසත් හොඳයි. මේ විදියයි මේකේ හැටි. ඒක නිසා කියනවා **ඵස්ස පච්චයා වේදනා** කියලා.

වේදනාවල් තිබෙනවා 6ක්. ඒ හයෙන් මම කිව්වේ ඇස සම්බන්ධ කරලා පමණයි, තේරුම් ගන්න ලේසි නිසා.

- චක්ඛුසම්ඵස්සජා වේදනා
- සෝත සම්ඵස්සජා වේදනා
- ඝාණසම්ඵස්සජා වේදනා
- ජිව්හා සම්ඵස්සජා වේදනා
- කායසම්ඵස්සජා වේදනා
- මනෝසම්ඵස්සජා වේදනා.

මෙතැන 'සම්ඵස්සජා' කියලා කියන්නේ සම්ඵස්සයෙන් උපන්, සම්ඵස්සය නිසා පහළ වූ කියන එක. 'ජා' කියලා කියන්නේ ජනිත කළා කියන එකයි. මනෝසම්ඵස්සජා වේදනා කියලා කියන්නේ මනෝසම්ඵස්සය නිසා ඇති වෙච්ච වේදනාව කියන එකයි. ඒවා හරි සියුම්. ඒවාට කියනවා ධම්මාරම්මණ කියලා.

තවත් කාරණයක් තිබෙනවා දැනගත යුතු.

- රූපයක් දැකීමේදී ආයතන දෙකක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ තමයි මානායතනය සහ චක්ඛායතනය.



- සද්දයක් ඇසීමේදී සෝතායතනය සහ මනායතනය සම්බන්ධ විය යුතුයි.
- ගඳ සුවඳ දැනගැනීමේදී ඝාණායතනය සහ මනායතනය සම්බන්ධ විය යුතුයි.
- රස දැනීමේදී ජිව්හායතනය සහ මනායතනය සම්බන්ධ විය යුතුයි.

- කයනිසා ඇතිවෙන වේදනාවක් දැනගැනීමේදී කායායතනය සහ මනායතනය සම්බන්ධ විය යුතුයි.

  චක්ඛායතනය - සෝතායත්නය - ඝාණා යතනය - ජිව්හායතනය - කායායතන යන ආයතන 5 බාහිර අරමුණු සම්න්ධයෙන් වැඩ කරන ආයතන.

- නමුත් මනායතනයට තනියම වැඩ කරන්න පුළුවන්, මනායතනය සිතුවිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන ආයතනයක්.

මනායතනයට අරමුණු වෙන්නේ ධම්මාරම්මණ. ධම්මාරම්මණ හරි සියුම්. ඒවා බොහෝම සියුම් නාම ධර්ම හැටියටයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ ධර්ම වලත් තිබෙනවා සිත සනසවන අමුතු ගතියක්. අපිට මනායතනයට දැනෙන දේවල් වලට උදාහරණ වශයෙන් 'නම්බුව' 'තත්වය' 'උගත්කම' කියන ඒවා ගන්න පුළුවන්. ඒවාගේම තමයි PhD කියන එකත්. මේවා හිතට දැනෙන දේවල්. ඒවගේම තමයි 'කරුණාව' 'දයාව' 'මෛත්‍රිය' 'wisdom' intelligence කියන ඒවත් හැඟෙන්නේ මනසට. මේවා ඔක්කෝම මනායතනයට ස්පර්ශ වෙන දේවල්. මේවා අපි සුළුවට ගත්තට මේවා අස්සේ තිබෙන ආරම්මණය සහ ආරම්මණ රසය හරි බලවත්.

මේවගේ හිතට දැනෙන අරමුණු වලත් තිබෙනවා ඒ ආරම්මණය වගේම අපේ හිත සනසවන අපේ හිත පිරිමද්දවන සතුටු කරවන අමුතු විදියේ ගතියක්. උගත්කම හොඳයි. උගත්කම හැම කෙනාටම තිබිය යුතුයි. නමුත් තත්ව තානාන්තර කියන ඒවා වෙනස්. උදාහරණයක් ලෙස කියනවා නම් තමන්ට ලැබී තිබෙන උපාධියක්, තත්වයක්, තානාත්තරයක් ගැන කවුරු හරි කියනවානම් ඒක ඇහෙනකොට හිතට හරි රසයක් සැනසීමක් දැනෙනවා. ඒවාට කියන්නේ ධම්මාරම්මණ කියලා. ධම්මාරම්මණ හොඳ ඒවත් තිබෙනවා නරක ඒවත් තිබෙනවා.

නින්දාව - අපහාසය - බය කියන ඒවත් ධම්මාරම්මණ. ඒවාගෙන් හිත හූරවනවා තෙරපවනවා, දවනවා, හිත පුච්චනවා. 'මනෝ විඤ්ඤාණයෙන්' ඒ අරමුණ දැනගන්නවා. 'වේදනාව' එහි තිබෙන්නාවූ කර්කෂ ගතිය දුකෙන් විඳිනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අරමුණු රසය එක එක්කෙනාට වෙනස් වෙන්න පුළුවන්?

<u>පිළිතුර</u> - ඔව් පුළුවන්, ඒක රටින් රටට වෙනස් වෙනවා, පළාතෙන් පළාතට වෙනස් වෙනවා, කාලෙන් කාලෙට වෙනස් වෙනවා, පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙනවා.

කොටි පැටියට කොටි දෙන ආරක්ෂා කාරියි. කොටි පැටියා කොටි අම්මා එනකොට සතුටුයි. නමුත් කොටි දෙන අපි ගාවට ආවොත් ඊට වඩා වෙනස්. එතකොට ප්‍රතිචාර දක්වන්නේ වෙනදියකට. ඒවගේ තමයි සමහර අයට මාළු වල තිබෙන ගන්ධය හොඳයි. සමහරුන්ට ඒක හොඳ නෑ. එහෙමත් තිබෙනවා. සමහර අයට දූරියන් සුවඳයි. සමහර අයට ගඳයි.

ඒක කාල වශයෙන් ගත්තහම මෙහෙම තිබෙනවා. කෑම බීම උයපු ගමන් රස්නෙන් මේසය උඩින් තිබ්බහම ඒකේ දුම් යන ගතිය දැකපු ගමන් හිතට ප්‍රිය මනාම ගතියක් සතුටක් ඇතිවෙනවා. ඒක දවස් දෙකක් විතර එහෙම්ම තියලා ගිහින් බැලුවහම ඒ ගතිය වෙනස් වෙනවා. ඒ වගේ තමයි කාල වශයෙන් වෙනස් වෙන්නේ. ඒ වගේ දේශය වශයෙන් වෙනස් වෙනවා. ඒ වගේම අපි ස්පර්ශ කරන්නා වූ ද්වාර වශයෙනුත් වෙනස් වෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස රහතන්වහන්සේ සිතෙත් වේදනාව තිබෙනවද?

<u>පිළිතුර</u> - තිබෙනවා, කෙලෙස් දුරු කරලා රහත් වෙනවා කියලා කියන්නේ දුක්ඛ වේදනාව නසාගෙන සැප වේදනාව නසාගෙන උපේක්ෂා වේදනාව විතරක් ඉතුරුකර ගන්නවා කියන එක නොවෙයි. රහත් වෙනවා කියලා කියන්නේ කෙලෙස් දුරු කරනවා, තණ්හාව දුරු කරනවා, උපාදානය දුරු කරනවා, භව නැති කරනවා, අවිද්‍යාව නැති කරනවා හැරෙන්න උපේක්ෂා වේදනාව ඉතුරුකර ගෙන සැප වේදනාවයි දුක් වේදනාවයි නසන්නේ නෑ. රහත් වෙනවා කියන්නේ වේදනාව නසන එක නොවෙයි. රහත් වෙනවා කියලා කියන්නේ කෙලෙස් නසන එක.

අපිට වේදනාවක් ආවහම අපි ඒකට ප්‍රතිචාර දක්වන්නේ කෙලෙස් සහගතව. රහතන්වහන්සේට වේදනාවක් ආවහම ඒ වේදනාවට ප්‍රතිචාර දක්වන්නේ කෙලෙස් සහගතව නොවෙයි. නමුත් රහතන්වහන්සේට සැප වේදනාවත් තිබෙනවා දුක්ඛ වේදනාවත් තිබෙනවා උපේක්ෂා වේදනාවත් තිබෙනවා. ආරම්මණය සම්බන්ධයෙන් බහුලව තිබෙන්නේ උපේක්ෂා වේදනාවයි. අපි හිතමු සීතල කාලයට උණුවතුර නාන්න ලැබුණොත් ඒක උන්වහන්සේලාට සැප ස්වභාවයෙන් නොදැනී යන්නේ නෑ. ඒකෙ සැප ස්වභාවයක් තිබෙනවා. රහතන්වහන්සේලාට තිබෙන්නේ ඒ සැප ස්වභාවයට ඇලෙන්නේ නැති ගතිය.

<u>ප්‍රශ්නය</u> - දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති කියලා බුදුහාමුදුරුවෝ දේශනා කළේ ඒක වෙන්න ඇති?

<u>පිළිතුර</u> - දිට්ඨෙ දිට්ඨමත්තං කියලා එතැන කියන්නේ, අපි අරමුණුත් එක්ක ගණුදෙනු කිරීමේදී පාර තොටේදී අපිට අරමුණු හම්බ වෙනවා. තාර පාරයි වාහනයි හැර තවත් මිනිස්සු - ළමයි - බල්ලෝ වගේ ලොකු කුඩා අරමුණු ගොඩක් හම්බවෙනවා. මේ අරමුණු ආවහම අපි පොඩි වෙලාවක් ඒවත් එක්ක සම්බන්ධතාවයක් හදලා අත්හැරලා දානවා.

අපි හිතමු අපි airport එක කිට්ටුවෙන් යනකොට plane එකක් බස්සවනවා කියලා. මේ plane එක දැක්ක ගමන්ම අපි එක්කෝ අනාගතේට යන්න තිබෙන tour එකක් plan කරනවා නැත්නම් ගිය එකක visual එකක් බලනවා. නැත්නම් මේ විදියට යන්න ඕනේ කියලා හිත ඇතුලේ කථාවක් හදනවා. එතකොට දිට්ඨෙ දිට්ඨමත්තං නොවෙයි. දිට්ඨෙ දිට්ඨමත්තං කියලා කියන්නේ ඒවගේ කථා හදන්නේ නෑ.

ඒවගේම අපි වෙනත් කාර් එක්ක යන බල්ලෙක් දැක්කොත් ඒ බල්ලාගේ පින්තූරය අපි හිතට අරගෙන වෙනත් ගෙදරක ඉන්න ඒවගේ බල්ලෙක් මතක් කරගෙන ‘මමත් ඒවගේ

බල්ලෙක් ගන්න ඕන' කියලා පොඩි කථාවක් හිතෙන් හදාගන්නවා. ඒක කරන්න එපා කියන එක තමයි දිට්ඨෙ දිට්ඨමත්තං කියලා කියන්නේ.

<u>ප්‍රශ්නය</u> - බුදුරජාණන් වහන්සේලාට වර්ණ සටහන් විතරක්ද ඇතිවෙන්නේ?

<u>පිළිතුර</u> - වර්ණ සටහන එනවා. නමුත් ඒ ක්‍රියාවලිය මගදී නවත්වන්න බෑ. රූපයක් ඇසට ගැටිලා ඇතුලේ වෙන process එකක් තිබෙනවා. ඒක නවත්වන්න බෑ. ඒක දිගටම යනවා. නමුත් වෙන්න ඕනෑ වෙන්නේ ඒක ගිහිල්ලා අවසානයේ එක තැනකදී තදට වැදිලා ඉවරවෙනකොටම කෙලෙස් සහගත මනසකින් ඒක අරගෙන පොඩි කථාවක් හදනවා. ඒ කියන්නේ අපි විතර්කනයක් පටන් ගන්නවා. ඒ විතර්කනය නවත්වා ගන්නයි ඕනේ.

අපිට රහත් චිත්තය පහළ වෙනකම්ම සිත්වල අඩු වශයෙන් හෝ වැඩි වශයෙන් කෙලෙස් හැදෙනවාමයි.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමින්වහන්ස අනාගාමීන් වහන්සේලාට කොහොමද දිට්ඨෙ දිට්ඨමත්තං කියන එක බලපාන්නේ?

<u>පිළිතුර</u> - අනාගාමීන් වහන්සේලාට කෙලෙස් සමුදායක් නැසී ගිය හින්දා පෘතක්ජනයන් වගේ හිතන්න යන්නේ නෑ.

බුදුරජාණන් වහන්සේ යම්කිසි කෙනෙකුට දකින්න ලැබුණොත් 'මේ තමයි තථාගතයන් වහන්සේ, දැක්කා දැක්ක පමණයි, දිට්ඨෙ දිට්ඨමත්තං' කියලා එහෙම කරන්නේ නෑ. බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා වන්දනා කරලා උපස්ථාන කරලා කරන්න අවශ්‍ය සෑම දෙයක්ම කරනවා. රහතන්වහන්සේලාත් කරනවා ආනාගමීන් වහන්සේලාත් කරනවා. සෝවාන් සකෘදාගාමී ආදී සියලුම මාර්ග ඵල ලාභීන් ඒවා කරනවා.

ඔය ප්‍රශ්නය තිබෙන්නේ හැම වෙලාවෙම අකුසල කර්මයේ තමයි. අවසානයේදී කුසලයයි අකුසලයයි දෙකම නැති කරනවා. නමුත් මූලික ප්‍රතිපදාවේ අකුසල් කර්ම හැදීමේ තමයි ඔය ප්‍රශ්නය එන්නේ.

දැන් අපි කිව්වේ **ඵස්ස පච්චයා වේදනා** කියන තැනදී ස්පර්ශය තමයි වේදනාව පහළ වෙන්න ළඟම හේතු කාරණාව වෙන්නේ කියලා. ස්පර්ශය නිසා වේදනා තුනක් ඇතිවෙනවා. සැප වේදනාව, දුක්ඛ වේදනාව සහ උපේක්ෂා වේදනාව. නැවතත් වේදනාව 5 ආකාරයකට දේශනා කරනවා. ඒ තමයි සැප වේදනාව - සෝමනස්ස වේදනාව - දුක්ඛ වේදනාව - දෝමනස්ස වේදනාව - උපේක්ෂා වේදනාව.

දැන් අපි බලමු වේදනාව නිසා තණ්හාව උපදින ආකාරය. වේදනාව හැදිච්ච ගමන්ම වේදනාව හේතුකරගෙන පහළ වෙනවා ඒකට ඇලීමක් බැඳීමක් ඇතිකරන ගතියක්. දැන් ස්වාමීන්වහන්සේලා කෙනෙකුට ආශිර්වාද කරනවා. ඒ ආශිර්වාද කිරීම තුල තිබෙන්නේ දුක්ඛ වේදනාවයි සැප වේදනාවයි බද්ධ කථනයක්. අපි කියනවා නිදුක් වේවා නිරෝගී වේවා දීර්ඝායුෂ ලැබේවා කියලා. නිදුක් වේවා කියලා කියන්නේ දුක්ඛ වේදනාව ඇති

නොවේවා කියන එක. ඒකෙන් කියන්නේ ලෙඩ දුක් නිසා ඇතිවෙන කායික වේදනාවක් හෝ අසත්පුරුෂ දර්ශනයක් නිසා හෝ සද්දයක් නිසා හෝ දුක්ඛ වේදනාවක් ඇති නොවේවා කියන එක. නිරෝගී වේවා කියලා කියන්නේ ලෙඩ දුක් කරදර සම්බන්ධයෙන් වේදනාවක් ඇති නොවේවා කියලා. ඊට පස්සේ දිගා සිරි වේවා කියලත් අපි ප්‍රාර්ථනා කරනවා. මේ හැම එකකින්ම කියන්නේ ‘මෙන්න මේ වගේ වේදනා ටිකක් මේ අයට ඇතිවේවා’ කියලා. සෙත් පතනවා කියලා කරන්නේ මෙන්න මේ වගේ එකක්.

තවත් අපි කියනවා රැකී රක්ෂා කටයුතු හොඳින් කරගෙන යන්න ලැබේවා කියලා. ඒකත් සැප වේදනාවක් හෝ උපේක්ෂා වේදනාවක්. එතකොටත් හිතට කිසිම කනසල්ලක් නෑ, ඔක්කොම හොඳයි. ඒ වගේම ආහාර පාන ඇඳුම් පැළඳුම් යාන වාහන ලැබේවා කියලත් ප්‍රාර්ථනා කරනවා. එතකොටත් ඔක්කොම ලබෙන්නේ සැප වේදනා. ඒවගේම විවාහ මංගල්‍යය වලදීත් හොඳ දූ දරුවෝ ලැබේවා කියලා ප්‍රාර්ථනා කරන්නෙත් ඒ අයගේ සිත් වලට සැප වේදනාව ලබා දෙන්න. මේ හැම තැනකම මූලික වෙන්නේ වේදනාව. ආශිර්වාද කරනවා කියන්නේ සැප වේදනාව ලබා දෙන කරුණු ලැබේවා කියලා ප්‍රාර්ථනා කිරීම.

විශේෂයෙන්ම විවාහ උත්සව වලදී මේ වගේ සැප වේදනාවල් ලබාදෙන ප්‍රාර්ථනාවල් ඇසෙන විට ඒ අයගේ සිත් වලට සතුටක් ඇතිවෙනවා. ඒ වගේම ඒක බලාගෙන ඉන්න අනිත් අයටත් එවැනි අවස්ථාවක් ලබා ගැනීමට ආසාවක් ඇතිවෙනවා. ඒක තණ්හාවක්. යම් කිසි වෙලාවක සැප වේදනාවක් ඇති උනාද ඒ සැප වේදනාව දික් ගස්සා ගන්න, ඒක ඉස්සරහට continue කරගන්න, ඒ සැප වේදනාව නැවත ලබාගන්න කරන්නා වූ උත්සාහයම තණ්හාවක්. **ඒක නිසා සැප වේදනාවක් යම් කිසි වස්තුවකින් - යම්කිසි අරමුණකින් ලැබෙනවාද ඒ වස්තුවලට ලෝභ කරන්නේ තණ්හාව නිසා.** ඒවා නැවත නැවත ලැබුණොත් තමයි සැප වේදනාව ලබා ගන්න පුළුවන් වෙන්නේ. ඒක නිසා කියනවා **වේදනා පච්චයා තණ්හා** කියලා. අපි සැප වේදනාවට හරි ආසයි. වේදනාව මුල් කරගෙන ඒ වේදනාව ලබා දෙන දේවල් වලට අපි ආස කරනවා.

ඒක සංකල්ප වශයෙන් තිබෙනවා, වස්තු වශයෙන් තිබෙනවා, හැඩ ගුණ වශයෙන් තිබෙනවා. හැම අරමුණකම තිබෙනවා ආරම්මණ රසයක්. ඒක වැඩෙන්න වැඩෙන්න තණ්හාව වැඩි වෙනවා. අනිත් එක තමයි නම්බු නාම කිර්ති ප්‍රශංසා ලැබෙන කොටත් ඒවාට තණ්හා කරනවා.

වේදනා පච්චයා තණ්හා කියලා කිව්වහම

- සුඛ වේදනා පච්චයා තණ්හා
- දුක්ඛ වේදනා පච්චයා තණ්හා
- උපේක්ඛා වේදනා පච්චයා තණ්හා කියලා තුනක් තිබෙනවා.

සුඛ වේදනා පච්චයා තණ්හා කිව්වහම ඒ සැප වේදනාව continue කරගන්න සහ ඒ සැප වේදනාව ඉදිරියටත් මතු කරලා දෙන ඕනෑම දේකට ලෝභ කරනවා. දුක්ඛ වේදනාවක්

ආවහම අපි කරන්නේ ඊට වඩා විරුද්ධ දෙයක්. ඒ දුක්ඛ වේදනාවෙන් යට වී තිබෙන සැප වේදනාව මතු වේවා කියලා ඒ සැප වේදනාව මතුකරගන්න උත්සාහයක් කරනවා. දුක්ඛ වේදනා පච්චයා තණ්හා කියලා කිව්වහම දුක්ඛ වේදනාවට නොවෙයි අපි තණ්හා කරන්නේ. දුක්ඛ වේදනාව එපා කරවලා ඒක නසාගෙන සැප වේදනාව මතු කරගන්න උත්සාහ කරන්නේම සැප වේදනාවට තිබෙන ලෝභය නිසා. ඒ අතර වාරයේදී යම්කිසි විදියකින් අපි බලාපොරොත්තු වෙන සැප වේදනාව නොලැබී මධ්‍යස්ථ වේදනාවක් ලැබුණොත් එය උපේක්ෂාවෙන් ගන්න ගතියක් තිබෙනවා. උපේක්ෂා වේදනාව එපා කියන්නේ නෑ.

මේ විදියට අපි දුක්ඛ වේදනාව නසාගෙන සැප වේදනාවට ලෝභ කරනවා. ඒක නිසා සැප වේදනාව ලබා දෙන කෑම බීම ගෙවල් දොරවල් යාන වාහන සෑම දේම අපි පතනවා. මිනිස්සුන්ට මෙහෙම දෙයක් තිබෙනවා.

නොතේරුම් කම නිසා සාමාන්‍යයෙන් මිනිස්සුන්ට හැඟීමක් තිබෙනවා හොඳට ඇඳලා පැලඳලා වාහනයකින් ලොකු restaurant එකකට හරි හෝටලේකට හරි ගිහිල්ලා අනිත් අයට පේන්න හැසිරෙමින් කෑම බීම ගන්න. එයා එයාගේ සල්ලි වලින් මෙහෙම කෑම බීම ගත්තත් ඒ අතරතුර එයා මනෝමය වශයෙන් විඳීමක් කරනවා. ඒ විඳීම කරන්නේ 'මම මේ වගේ හොඳ තත්වයක කෙනෙක්' කියලා හිතින් නිර්මාණය කරගෙන ඒ නිර්මාණ ලෝකය එයා අත් විඳිනවා. ඒ විඳීම එයාට කෑමට වඩා රසවත්. එයා ඒකට වියදම් කරනවා. එයාට ඇත්තටම ඕනෑ වෙන්නේ බඩගිනි නැති කරගැනීමම නොවෙයි. ඊට වඩා එහා ගිය මනෝමය ධර්මයක් තිබෙනවා. එයා ඒකටයි ආසා කරන්නේ. එයා ඒකටයි තණ්හා කරන්නේ. ඒක නිසා එතැන ඇතිවෙන වේදනාව හරි බලවත්. ඒක නිසා කියනවා **වේදනා පච්චයා තණ්හා** කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස උපේක්ෂා වේදනාව තිබෙන එක්කෙනා ඒක සුඛ වේදනාවක් කරගන්නද බලන්නේ නැත්නම් ඒක එහෙමම පවත්වා ගන්නද?

<u>ස්වාමීන්වහන්සේ</u> - උපේක්ෂා වේදනාව කරදරයක් නෑ. ඒක ඒ විදියට තිබෙනවානම් හොඳයි කියලා හිතනවා. අනිත් එක තමයි දුකක් නැත්නම් සැප වේදනාවක් ලැබුණේත් නැත්නම් උපේක්ෂා වේදනාව හෝ ලැබේවා කියලා හිතනවා. දුක නැතුව වෙන ඕනෑම සැප හෝ උපේක්ඛා වේදනාව ප්‍රාර්ථනා කරනවා.

සැප වේදනාව ලබාදෙන අරමුණු රාශියක් තිබෙනවා. කෑම බීම් වශයෙන්, ගෙවල් දොරවල් වශයෙන් කථා කිරීම් ආදී වශයෙන් අරමුණු රාශියක් තිබෙනවා. මේ **වේදනා පච්චයා තණ්හා** කියන එක විසාල පරාසයක තිබෙන්නේ. අපි සාමාන්‍යයෙන් ප්‍රධාන ප්‍රධාන කොටස් ටික විතරයි කියන්නේ. ඒ උනාට සැඟවිලා කුඩා - අනු කුඩා ස්නායු වශයෙන් හැමතැනම පැතිරිලා තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සමහර කෙනෙකුගේ කිට්ටුම කෙනෙක් නැති උනාට පස්සේ අවුරුදු ගානක් ඒ ගැනම කිය කියා දුක් වෙන්නේ දුක්ඛ වේදනාවට තණ්හා කරන නිසාද?

<u>පිළිතුර</u> - නෑ නෑ, ඒක දුක්ඛ වේදනාවට ඇති තණ්හාව නොවෙයි. එතැන තිබෙන්නේ එයාට සතුට ගෙනදෙන්නා වූ පුද්ගලයා හිතෙන් අතහරින්නේ නැති ලෝභකම. ඒ පුද්ගලයා ජීවත් වෙලා ඉන්දෙද්දී එයාට ලැබුණා සැපයක්. එයා ඒකට තද බල විදියට උපාදානය වෙලා තිබෙන්නේ. ඒ උපාදානය නිසා එයා ගැන කථා කිරීම එයා ගැන හිතීම එයා ගැන මෙනෙහි කිරීම එයාට හොඳයි. ඒකෙන් හිත අයින් කරගන්න බැරි එකයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. එයා සැප වේදනාවට තණ්හාවයි. නමුත් සැප වේදනාව යටකරගෙන දුක් වේදනාව ඇවිල්ලා තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම යම්කිසි නෑදැයෙක් හෝ හිතවතෙක් අපිට ඉන්නවා කියලා කියන එකෙන් අපිට සැපයක් දැනෙනවා. ඒ සැපය තමයි අපි විඳින්නේ. ඒ මනුස්සයගෙන් අපිට කිසිම ආරක්ෂාවක්වත් මොකක්වත් ලැබෙන්නේ නැත්නම් අපිට එයා වැඩක් නෑ. ඒ නෑදැයා හෝ හිතවතා ළඟ ඉන්නකොට එයා මගේ ආරක්ෂාවට ඉන්නවා කියලා අපිට අමුතු විදියේ ගතියක් හැඟීමක් ඇති වෙනවා. ඒක තමයි අපි විඳින්නේ.

හොඳයි සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා, ප්‍රාර්ථනා කරනවා.

සාධු! සාධු! සාධු!

ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.